““`
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1974/18 – 2016 ජූලි 07 වැනි බ්‍රහස්පතින්දා – 2016.07.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත විස්තර කරනු ලබන ඉඩම පොදුජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ, ඉඩම් අමාත්‍ය ජෝන් ඇන්තනී එම්මානුවෙල් අමරතුංග වන මම, මෙයින් ප්‍රකාශ කරමි.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ගොඩකවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අටකලන් කෝරළේ තඹගමු පත්තුව සුළු කොට්ඨාසයේ බලවින්න ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කරන ලද අංක ආර්/ජීඩීකේ/2014/621 සහ 2014.12.17 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව සඳහන් ප්‍රමාණයෙන් හෙක්. 0.0025ක් පමණ වන හිඟුරුගල යාය නමැති ඉඩම් කැබැල්ලට මායිම්:

01. කැබලි අක්ෂර 'ඒ' – හිඟුරුගල යාය – ප්‍රමාණය: හෙක්. 0.0025ක් පමණ

උතුරට: ඩබ්ලිව්. එම්. පොඩිඅප්පුහාමි හිමිකම් කියන හිඟුරුගල යාය සහ මාර්ගය (ප්‍රාදේශීය සභා); නැගෙනහිරට: මාර්ගය (ප්‍රාදේශීය සභා) සහ ඩබ්ලිව්. එම්. පොඩිඅප්පුහාමි හිමිකම් කියන හිඟුරුගල යාය; දකුණට: ඩබ්ලිව්. එම්. පොඩිඅප්පුහාමි සහ ඩී. කේ. විජේසිංහ හිමිකම් කියන හිඟුරුගල යාය; බටහිරට: ඩී. කේ. විජේසිංහ සහ ඩබ්ලිව්. එම්. පොඩිඅප්පුහාමි හිමිකම් කියන හිඟුරුගල යාය.

ජෝන් ඒ. ඊ. අමරතුංග,
ඉඩම් අමාත්‍ය.

මගේ අංකය: 4/3/9/2013/ඩබ්ලිව්එස්/23.
2016 අප්‍රේල් මස 18 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
අංක 1200/6,
"මිහිකත මැදුර", රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

07 - 886

1A – G 23785 – 17(2016/07)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*